**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**පන්තිය -** 11 ශ්‍රේණිය **විෂය -** නාට්‍ය හා රංග කලාව **අදාල සතිය -** අප්‍රේල් 3 වන සතිය

**පාඩම හා ඒකකය -** 2.4.1 නාට්‍යමය අවස්ථා හඳුනාගැනීම .

**ශිෂ්‍යා කළ යුතු කාර්යයන් ,**

- කියවීමේ පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කර සටහන් පොතෙහි පිටපත් කරගැනීම.
- හැකිනම් වේදිකා නාට්‍යවල video පට හෝ නරඹා නාට්‍යමය අවස්ථා අධ්‍යයනය කිරීම.
- මෙම පාඩමට අදාල අන්තර්ජාලය ඇති video පාඩම් නැරඹීම හා අධ්‍යයනය.
  https://www.youtube.com/watch?v=wJ2Mi09hGuI&t=1s
- https://www.youtube.com/watch?v=InhrCitmixs

**කියවීම් පත්‍රිකාව**

කිසියම් නාට්‍යයක ගැටුමක් සහිත අවස්ථාවක් නිරූපණය කිරීමෙන් නාට්‍යමය අවස්ථාවක් බිහි වේ. නාට්‍යක කතා ප්‍රවෘත්තියක් තුළ අවස්ථා රසක් දක්නට ලැබෙන අතර චරිත හා ක්‍රියා උපයෝගී කරගනිමින් එම අවස්ථා ගොඩ නැංවෙන අතර ගැටුමක් ඇතුලත් අවස්ථා නාට්‍යමය අවස්ථාවක් සේ නිර්මාණය වේ.

නාට්‍යමය අවස්ථා සඳහා උදාහරණ ලෙස ,

- මනමේ නාට්‍යයේ වැදි රජු සහ මනමේ කුමරු අතර සටන් අවස්ථාව
- හුණුවටයේ කතාව නාට්‍යයේ වැල් පාලමේ ගීතය අවස්ථා අවස්ථාව

ගැටුමක් කුතුහලයක් දෙගිඩියාවක් ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලින් දෙකක් පවතින ආකාරයට ගොඩනැගී ඇති අවස්ථා නාට්‍යමය අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය.

**නාට්‍යමය අවස්ථා ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ,**

- යම්කිසි සිදුවීමක් අතරින් නාට්‍යමය අවස්ථා තෝරා බේරා ගන්නා ආකාරය අවබෝධ කර ගැනීම
- ප්‍රේක්ෂක රසවින්දනයට බාධාවක් ඇති නොවන ආකාරයෙන් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම
- රූපණය සඳහාම සඳහාම නිර්මාණය කරන්නත් බැවින් වේදිකාව මත රඟ දැක්වීමට හැකි අයුරින් නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම.

**ඉගෙනුම් ඵල**

- නාට්‍යමය අවස්ථාවක් යනු කුමක් දැයි ප්‍රකාශ කරයි
- නාට්‍යමය අවස්ථාවක ස්වභාවය පැහැදිලි කරයි .
- නාට්‍යමය අවස්ථා වෙන් කර දක්වයි .
- නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කරයි .

**පැවරුම්**

**1.** නාට්‍යමය අවස්ථාවක් යන පැහැදිලි කරන්න .

2.විකෘති නාට්‍යයේ ඇති නාට්‍යමය අවස්ථා පෙළගස්වන්න

3.පහත දෙන ලද විස්තරයට අනුව නාට්‍යමය අවස්ථාවක් ගොඩනගන්න .

" මන්ද්‍රි දේවිය පලවැල නෙළා ගෙන ඒමට ගිය අතර ජූජක බමුණා වෙස්සන්තර රජු ඉදිරියට පැමිණ දරුවන් දෙදෙනා ඉල්ලා සිටි .රජු දරුවන්ගේ විරෝධය නොතකා දරුවන් දන් දීමට පෙළඹේ. දරු දෙදෙනා එයට විරෝධය පාති "

**සැකසුම - කෑගල්ල අධ්‍යාපන කලාපය**